(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 2(12)]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2009 මාර්තු මස 06 වැනි සිකුරාදා**

**2009 මාර්තු මස 17 වැනි අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1103/'08

ගරු ජිනදාස කිතුලගොඩ මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලුනාව පාරිසරික සහ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය අදියර කොපමණ සංඛ්‍යාවකින් අවසන් කිරීමට නියමිතව තිබුණේද;

(iii) එහි කොපමණ අදියර සංඛ්‍යාවක් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් නිමකර තිබේද;

(iv) ඉතිරි අදියර අදාළ අමාත්‍යාංශය විසින් පවරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) එසේ නම්, අදාළ අමාත්‍යාංශය යටතේම ඇති සංස්ථාවට මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා සියලු සුදුසුකම් හා හැකියාව තිබියදී මෙම පවරා ගැනීම සිදුකළේ කවර හේතුවක් නිසාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1130/'08

ගරු ආර්. එම්. රංජිත් මද්දුමබණ්ඩාර මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) බිබිල මැතිවරණ කොට්ඨාසයේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත්, මැතිවරණ සංවත්සර නිවාස 10 යෝජනා ක්‍රමයේ, අංක 04 දරන නිවසේ නිවාසලාභියා වන එල්. ඒ. ගුණතිලක මහතා විසින් නිවසේ තක්සේරු වටිනාකම වූ රුපියල් 18,000.00 ක් හා ඔප්පු ගාස්තු වන රුපියල් 1,008.00 ක මුදලක් 2006.02.01 දිනය වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) දැනට වසර දෙකකට ආසන්න කාලයක් ඉක්ම ගොස් ඇතත්, අදාළ නිවස සඳහා වූ ඔප්පුව මෙතෙක් ඔහු වෙත ලබා දී නොමැති බව එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) එල්. ඒ. ගුණතිලක මහතාට අදාළ නිවසේ ඔප්පුව කඩිනමින් ලබාදීමට එතුමිය අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0995/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 රාජ්‍ය නාට්‍ය උළෙලේ හොඳම නාට්‍යය ලෙස රාජ්‍ය සම්මානයෙන් පිදුම්ලද නාට්‍යය කවරේද ;

(ii) එම නාට්‍යයේ නිෂ්පාදකවරයා කවුරුන්ද;

(iii) එම නාට්‍යය සම්මාන ලැබූ අනෙකුත් අංශ සහ එසේ සම්මාන ලද පුද්ගලයන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය සම්මාන දිනූ හොඳම නාට්‍යය, රටේ විවිධ ප්‍රදේශවල වේදිකාගත කිරීමට සංස්කෘතික දෙපාර්තමේන්තුව පියවර ගෙන තිබේද;

(ii) රාජ්‍ය නාට්‍යය උළෙලින් පසු සම්මාන ලද නාට්‍යකරුවන් දිරිගැන්වීම වෙනුවෙන් කවර හෝ පියවරක් ගෙන තිබේද;

(iii) හොඳම නාට්‍යය ලෙස සම්මාන ලැබීමෙන් පසු නාට්‍යකරුවන්ගේ මැදිහත්වීමෙන් හෝ දර්ශනවාර කොපමණ සංඛ්‍යාවක් වේදිකා ගත කර තිබේද;

(iv) ඒ කවර ප්‍රදේශවලද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1096/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර, කැකණදුර - යටියන මාර්ගය ඉදිකිරීම සඳහා මුල්ගල් තැබූ දිනය හා ඒ කවුරුන් විසින්ද;

(ii) එම මාර්ග ව්‍යාපෘතියට අදාළ මාර්ගයේ දිග හා පළල කොපමණද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කර තිබේද;

(ii) වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

(iii) මේ වන විට වැඩ අවසන් කර තිබෙන ප්‍රමාණය කොපමණද;

(iv) සම්පූර්ණයෙන් වැඩ අවසන් කරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1098/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "දක්ෂිණ භූමි" සහතික පත්‍ර බෙදාදීමක් සිදුවූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ බෙදාදෙනු ලැබූ සහතික පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම උත්සවයට වැයකළ සම්පූර්ණ මුදල කොපමණද;

(iii) ප්‍රචාරක කටයුතු සඳහා වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(iv) එම උත්සවයට අදාළව, පෝස්ටර්, බැනර් සහ කටවුට් සඳහා වැය කළ සම්පූර්ණ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1121/'08

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලේවත්ත ග්‍රාමනිලධාරී වසමේ අංක 47/3 හි පදිංචි පී. කේ. සිරිපාල මහතාට අක්කර 01 පර්චස් 03 ක් සඳහා මධ්‍ය /මීපේ/ ජන 0533 යටතේ ජයභූමි දීමනා පත්‍රයක් නිකුත්කර ඇති බවත්;

(ii) අනවසර පදිංචිකරුවෙකු වන ජී. එම්. පුංචිබණ්ඩා මහතා 47/3 කට්ටිගොඩ ඉඩමට සහ ඩී 49 අතුරු ඇලට දිගින් දිගටම හානි කිරීම නිසා මිනිපේ ප්‍රාදේශීය ලේකම් විසින් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ ක්‍රියා කර පුංචිබණ්ඩා මහතා ඇතුළු පවුලේ අය අධිකරණය මඟින් මෙම ඉඩමෙන් ඉවත්කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) සිරිපාල මහතාගේ සීමාව තුළ ඉහත අනවසර පදිංචිකරු තවමත් පදිංචිව සිටින බවත්;

(ii) සිරිපාල මහතා දශක පහකට අධික කාලයක් නිවසට ගමන්ගත් මාර්ගයද මෙම අනවසර පදිංචිකරු විසින් වසා දමා ඇති බවත්;

(iii) මහනුවර - මහියංගන මාර්ගය පුළුල් කිරීම නිසා ලබාදෙන වන්දි මුදල්ද පුංචිබණ්ඩා මහතා විසින් ලබාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත කරුණු පිළිබඳව පරීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) නොඑසේ නම්, එය නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) සිරිපාල මහතා ඇතුළු පවුලේ අය තම නිවසට යාමට භාවිත කළ ඉහත එකම මාර්ගය නිරවුල් කර දෙන ලෙස මහියංගන ඉඩම් කොමසාරිස් වෙත එතුමා අවශ්‍ය උපදෙස් දෙන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1143/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා දෙපාර්තමේන්තු කවරේද;

(ii) එම ආයතන හා දෙපාර්තමේන්තු පිහිටා ඇත්තේ කවර ගොඩනැගිලිවලද;

(iii) ඒවායේ ලිපිනයන් කවරේද;

(iv) එම ගොඩනැගිලි රජය සතු ඒවාද, නොඑසේනම් පෞද්ගලික හිමිකරුවන් සතු ඒවාද;

(v) පෞද්ගලික හිමිකරුවන් සතු වේනම් ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) එම ගොඩනැගිලිවල මාසික කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1144/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ තනතුරු, අධ්‍යාපන සුදුසුකම්, වයස සහ වැටුප් ප්‍රමාණය කොපමණද;

(iv) මෙම නිලධාරීන් වෙනත් රාජ්‍ය ආයතනයකින් අනුයුක්ත කර සිටීනම් ඒ කවර ආයතනවලින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත නිලධාරීන්ට ලබාදී ඇති වාහන කවරේද;

(ii) එම වාහනවල අංකය හා වර්ගය කවරේද;

(iii) මෙම වාහන පෞද්ගලික අයිතියකින් හෝ බදු/කුලී පදනම යටතේ හෝ ලබාගත් ඒවාද;

(iv) එසේ ලබාගත්තේ නම්, ඒ කවර පුද්ගලයින්ගෙන්ද;

(v) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(vi) මාසික කුලිය/බද්ද කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1145/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් තරුණ අභිවෘද්ධිය වෙනුවෙන් මෙතෙක් සිදුකර ඇති සේවාවන් කවරේද;

(ii) තරුණ අභිවෘද්ධියට ඉවහල් කරගත් ප්‍රදේශ කවරේද;

(iii) සේවා දායකත්වය සපයා තිබෙන තරුණයින් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ එක් පුද්ගලයෙකු වෙනුවෙන් වැයකර ඇති මුදල කොපමණද;

(v) මෙම තරුණයින්ගේ ආර්ථික සංවර්ධනයන් වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා,— ගොවිජන සංවර්ධන පනත යටතේ නියෝග,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 22, 23, 25 සහ 26 යන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 95 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2009 ජනවාරි මස 21 දිනැති අංක 1585/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2009.03.03 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*

වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*

වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම (සන්නද්ධ හමුදා) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## 2009 මාර්තු මස 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1100/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) "බ්‍රොන් බ්‍රිජ්" නමින් මසුන් අල්ලන ධීවර සමාගමක් තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ධීවර සමාගමට අදාළව අධිකරණය විසින් තීන්දුවක් ලබා දී තිබේද ;

(ii) එසේනම් ලබාදුන් තීන්දුව කවරේද;

(iii) එම ධීවර සමාගම විසින් රජයට නොගෙවා පැහැර හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත නැව් සමාගම පසුගිය වර්ෂ පහ තුළ අපනයනය කරන ලද මාලු ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1101/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— සංස්කෘතික කටයුතු හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2008 වර්ෂයේ රාජ්‍ය සාහිත්‍ය උත්සවය පැවැත්වූ ස්ථානය සහ දිනය එතුමා මෙම සභාවට දන්වන්නෙහිද;

(ආ) (i) එම උත්සවයේ ප්‍රචාරක කටයුතු, ආහාරපාන ආදිය සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම උත්සවයට වැය කළ සම්පූර්ණ මුදල කොපමණද;

(iii) උත්සවය පැවැත්වූ දින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) උත්සවයට ගෙනඑන ලද ආහාරවලින් පරිභෝජනයට නොගෙන විනාශ කරනු ලැබූ ප්‍රමාණය සහ එහි මූල්‍ය වටිනාකම කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1109/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුඩාවැල්ල ධීවර ගම්මානයේ "පැතුම්" නමින් රාජ්‍ය නොවන සංවිධානයක් ලියාපදිංචි කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේනම් එය පිහිටවූ දිනය හා අදාළ ලිපිනය කවරේද;

(ii) එම සංවිධානයේ සභාපති හා ලේකම්ගේ නම හා ලිපිනය කවරේද;

(iii) සුනාමි ආධාර යටතේ එම සංවිධානයට ලැබුණු ද්‍රව්‍යමය ආධාර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) "ඇඩ්‍රා" නමැති රාජ්‍ය නොවන සංවිධානයෙන් ඉහත සඳහන් සංවිධානයට ලැබුණු ට්‍රැක්ටර් සංඛ්‍යාව කොපමණද;

(ii) එහි මූල්‍යමය අගය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1148/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දකුණු කොළඹ කළුබෝවිල ශික්ෂණ රෝහල වෙත දෛනිකව ප්‍රතිකාර සඳහා පැමිණෙන බාහිර රෝගීන්ගේ සාමාන්‍යය කොපමණද;

(ii) බාහිර රෝගී අංශයේ රෝගීන් පරීක්ෂාව සඳහා දෛනිකව සේවය කරන වෛද්‍යවරුන්ගේ සාමාන්‍යය කොපමණද;

(iii) බාහිර රෝගී අංශයේ එක් දිනකට සිටින හෙද හෙදි සංඛ්‍යාව කොපමණද;

(iv) බාහිර රෝගී අංශයේ එක් දිනකට සිටින සාත්තු සේවක - සේවිකා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් වෛද්‍යවරයෙකු දෛනිකව පරීක්ෂා කරන බාහිර රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍යය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1149/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කොළඹ මහ රෝහල වෙත දෛනිකව ප්‍රතිකාර සඳහා පැමිණෙන බාහිර රෝගීන්ගේ සාමාන්‍යය කොපමණද;

(ii) එක් දිනකට බාහිර රෝගී අංශයේ රෝගීන් පරීක්ෂාව සඳහා සිටින වෛද්‍යවරුන්ගේ සාමාන්‍යය කොපමණද;

(iii) බාහිර රෝගී අංශයේ එක් දිනකට සිටින හෙද - හෙදි සංඛ්‍යාව කොපමණද;

(iv) බාහිර රෝගී අංශයේ එක් දිනකට සිටින සාත්තු සේවක - සේවිකා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් වෛද්‍යවරයෙකු දෛනිකව පරීක්ෂා කරන බාහිර රෝගීන් සංඛ්‍යාවේ සාමාන්‍යය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1150/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2005, 2006, 2007 හා 2008 වර්ෂවලදී පිළිවෙලින් කොළඹ දිස්ත්‍රික්කය තුළ වාර්තා වී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු රෝගී තත්වයෙන් මියගොස් ඇති වැඩිහිටියන් හා ළමයින් සංඛ්‍යාව පිළිවෙලින් එකී වර්ෂයන්ට අදාළව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඩෙංගු රෝගය ලෙස හඳුනාගත් රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී ප්‍රමුඛතාවය ලබාදීමට රෝහල් තුළ තිබෙන වැඩ පිළිවෙළ කවරේද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) ඩෙංගු රෝගය වළක්වා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1162/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර දැරීම සඳහා නීත්‍යානුකූල සුදුසුකම් ඇත්තේ කවරෙකුටද;

(ii) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර නිකුත් කිරීමේදී පිළිපැදිය යුතු ක්‍රියාපටිපාටිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2008.04.30 දින වන විට වලංගු රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර දැරූ පුද්ගලයින්ගේ නම්, තනතුරු සහ අදාළ විදේශ ගමන් බලපත්‍රවල අංක කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1163/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 වර්ෂයේ සිට 2008 දෙසැම්බර් දක්වා වූ වසර 05 තුළදී රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර නීත්‍යානුකූල නොවන අයුරින් භාවිත කර දඬුවමට ලක්වූ අයගේ නම්, තනතුරු හා අදාළ විදේශ ගමන් බලපත්‍ර අංක කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නීති විරෝධී ලෙස රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍ර භාවිතා කර රටේ නීතිය උල්ලංඝනය කළ පුද්ගලයෙකු, ශ්‍රී ලංකාව අන්තර් ජාතික තලයේ නියෝජනය කිරීම සඳහා නිව්යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත ලෙස පත්කිරීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1164/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රයක් නීති උල්ලංඝනය වනසේ/නීත්‍යානුකූල නොවනසේ පාවිච්චි කළ අයෙකුට දෙන දඬුවම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) හේවාමාතර ගමගේ සිරිපාල පලිහක්කාර නමැති අයෙකු විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයෙකු ලෙස කටයුතු කළ බව එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත අය විශ්‍රාම ලැබූ දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) අංක ඞී 1943366 දරන රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය ඔහු සතුව තිබූ බවත්;

(ii) 2008 ජූනි මස හෝ ඊට ආසන්න කාලයක් දක්වා එම රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය පාවිච්චි කර ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඉ) (i) විශ්‍රාම ලැබූ පසුවත් තමන් දැරූ තනතුරු නාමයෙන් රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් දැරීම නීති විරෝධී නොවන්නේද;

(ii) එසේ නම්, එලෙස නීතිය උල්ලංඝනය කිරීම වෙනුවෙන් ලැබිය යුතු දඬුවම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0604/'08

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) දැයට කිරුළ 2008 ප්‍රදර්ශනය වෙනුවෙන් පළාත් සභාවලට අයත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සහභාගී වූයේද;

(ii) පළාත් සභා සහභාගීවූයේ නම්, එක් එක් පළාත් සභාව වෙන් වෙන් වශයෙන් කවර කටයුතුවල නිරතවීද;

(iii) එකී පළාත් සභා මගින් ප්‍රදර්ශන කුටි හෝ ප්‍රදර්ශන උපකරණ සපයන ලද්දේද;

(iv) එසේ නම්, එම එක් එක් පළාත් සභාව වෙන වෙනම කවර ප්‍රදර්ශන කාර්යයක නිරතවීද;

(v) එක් එක් පළාත් සභාවේ අමාත්‍යාංශ හෝ ආයතන මගින් ඉදිරිපත් කරන ලද ප්‍රදර්ශන කුටි සහ වැය කළ මුදල කොපමණද;

(vi) එම මුදල් වැය කරන ලද ආයතන හා අදාළ වැය ශීර්ෂය කවරේද;

(vii) සියලුම පළාත් සභා මගින් එම ප්‍රදර්ශනය සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0798/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1086/'08

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මහියංගන නගරයේ රජය සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම් කට්ටි ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) මහියංගන නගරයේ ඉඩම් කට්ටි දැනට පෞද්ගලික අංශයට ලබා දීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම් එම ඉඩම් කට්ටි ලබාදීමට අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත ඉඩම් ලබාගත් අයගේ විස්තර එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහි ද?

(ඈ) (i) එකී ඉඩම් ඉදිරියේදී පෞද්ගලික අංශයට ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) ඉදිරි කාලයේදී රාජ්‍ය අංශයේ ඉදිකිරීම් සඳහා මහියංගන නගරයේ වෙන් කර ඇති ඉඩම් කට්ටි කවරේද;

(iii) ඒවායේ ප්‍රමාණයන් හා අදාළ ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඉ) (i) රජයේ කාර්යාල සහ නිල නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් වෙන්කර නොමැති නම් ඊට හේතුව කවරේද;

(ii) අවශ්‍ය ඉඩම් වෙන් කරනු ලබන්නේ කවර ප්‍රදේශයකින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2009 මාර්තු මස 18 වැනි බදාදා)**

0780/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, වැලිවිටිය - දිවිතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0781/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0784/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, බලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0785/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, ගෝනාපීනුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0786/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0787/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0788/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0789/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0790/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, බෝපේ-පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0791/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, හබරාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0792/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, ඉමදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0793/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0794/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0795/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, නියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0796/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, තවලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0797/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගාල්ල, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලයේ සේවය කරන අනියම් හෝ ස්ථිර නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම කාර්යාල ආරම්භයේදී තිබූ තැපැල් බෙදීමේ සීමා මායිම් පුළුල් කර තිබේද;

(iv) ඒ කවර කාලසීමාව තුළ කවර කාර්යාලවලට අයත් සීමා මායිම්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට අලුතින් ගම්මාන ආරම්භ වී ගම් පුළුල්වීම හේතුවෙන් වත්මන් ලිපි බෙදීමේ සීමාවන් සංශෝධනය කර තිබේද;

(ii) ඒ අනුව එක් එක් තැපැල් කාර්යාලයේ එක් එක් ලිපි බෙදන්නෙකුට නියමිත නිවාස සංඛ්‍යාව සහ අදාළ දුර සීමාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2008 වර්ෂය වනවිට ඉහත තැපැල් කාර්යාලයන්හි පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම කොට්ඨාසය තුළ අලුතින් උප තැපැල් කාර්යාල ආරම්භ කිරීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, ඒවා කවර කාල සීමාවක් තුළ ආරම්භ කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1151/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නල මාර්ග ඔස්සේ 2008 අගෝස්තු 31 වැනි දින වන විට කොළඹ දිස්ත්‍රික්කයේ ජල සම්බන්ධතා ලබාගත් සංඛ්‍යාව කොපමණද;

(ii) දවසේ පැය 24 ම ජලය ලබාදෙන ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iii) දවසේ පැය 16 ට අඩුවෙන් ජලය ලබාදෙන ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iv) දවසේ පැය 8 ට අඩුවෙන් ජලය ලබාදෙන ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(v) දවසේ පැය 2 ට අඩුවෙන් ජලය ලබාදෙන ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දවසේ පැය 24ම ජලය ලබානොදෙන පාරිභෝගිකයින් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1153/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර් යන මාස තුන තුළ දී පිළිවෙළින් ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) මාසික වාර ප්‍රවේශපත්‍ර මගින් ලැබූ ආදායම කොපමණද;

(ii) එකී ආදායම, එම මාස තුන තුළ මගී ප්‍රවාහනය මගින් ශ්‍රී ලංගම ලද මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණ ප්‍රමාණයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාසයේ මුලදීම ලබන ආදායම හරහා බැංකු තැන්පතුවක් ලෙස අමතර පොලියක් අදාළ දෙපාර්තමේන්තුව උපයා ගන්නේද;

(ii) උක්ත මාස තුනට අදාළව එය කොපමණ මුදලක් ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1154/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2008 අගෝස්තු, සැප්තැම්බර්, ඔක්තෝබර් යන මාස තුන තුළ දී පිළිවෙළින් දුම්රිය මාසික වාර ප්‍රවේශපත්‍ර මගින් ලැබූ ආදායම කොපමණද;

(ii) එකී ආදායම, එම මාස තුන තුළ මගී ප්‍රවාහනය මගින් දුම්රිය දෙපාර්තමේන්තුව ලද මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස කොපමණ ප්‍රමාණයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මාසයේ මුලදීම ලබන ආදායම හරහා බැංකු තැන්පතුවක් ලෙස අමතර පොළියක් දෙපාර්තමේන්තුව උපයා ගන්නේද;

(ii) උක්ත මාස තුනට අදාළව එය කොපමණ මුදලක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1165/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— තරුණ අභිවෘද්ධි හා සමාජ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) එතුමා මෙම අමාත්‍ය තනතුරට පත්වූවාට පසුව විදේශ ගතවූ වාර ගණන සහ එම රටවල් කවරේද;

(ii) විදේශ ගතවූ හේතුව සහ අදාළ කාලය කවරේද;

(iii) ගතකළ දින ගණන කොපමණද;

(iv) එතුමා සමග විදේශ ගතවූ නිලධාරීන් කවුරුන්ද;

(v) ඔවුන්ගේ තනතුරු කවරේද;

(vi) එතුමා සමග විදේශ ගතවූ සියලු නිලධාරීන් මේ වනවිට ආපසු දිවයිනට පැමිණ සිටීද;

(vii) යම්කිසිවෙකු ආපසු නොපැමිණියේ නම්, ඒ කවුරුන්ද;

(viii) ඒ කවර හේතුවක් නිසාද;

(ix) විදේශගතවූ වාර වලදී වියදම් කළ මුදල කොපමණද;

(x) එම මුදල් වැය කළේ අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් නොවේ නම්, වෙනත් බාහිර ආයතනයකින්ද නම් එම ආයතනය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1123/'08

ගරු වජිර අබේවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 1994 - 2001 දක්වා වූ කාලය තුළ දේශපාලන වශයෙන් පළිගැනීම්වලට භාජනයවූ අධ්‍යාපන අමාත්‍යාංශයේ හා අනුබද්ධ ආයතනයන් හි නිලධාරීන්ට, විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට හා සේවකයන්ට සහන ලබාදීමට දැනට කටයුතු කර තිබේද;

(ii) එම කාල සීමාව තුළ එසේ නිර්දේශිතව අනුමත වූ සම්පූර්ණ නම් සංඛ්‍යාව කොපමණද;

(iii) ගාල්ල දිස්ත්‍රික්කයේ එසේ නිර්දේශිතව අනුමත වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නම් ලැයිස්තුව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පළිගැනීම් විමර්ශන කමිටුවට ගාල්ල දිස්ත්‍රික්කයෙන් කොපමණ සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට පැමිණියේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ඉහත විමර්ශන කමිටුව මගින් නිර්දේශිත බොහෝ අයගේ නම් අනුමත ලේඛනයෙන් ඉවත්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඉ) (i) එම කමිටුව නිර්දේශ කළ නාම ලේඛනය අනුමත කිරීමට ගාල්ල ප්‍රදේශයේ දේශපාලන බලවතෙකුගේ අනුමතියට යවන ලද්දේද;

(ii) එසේ ඉවත්වී ඇති සියලුම අය නැවත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර හෝ විමර්ශනය කර නියමිත සහන ලබා දෙන්නේද;

(iii) එසේ නොහැකි නම් එයට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0866/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) කච්චතිව් දූපතේ විශාලත්වය කොපමණද;

(ii) එම දූපතේ සම්පූර්ණ ජනගහනය කොපමණද;

(iii) එහි ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉන්දීය රජයට එම දූපතේ අයිතිය නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එම දූපත සම්බන්ධයෙන් ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවේ රජයට කරන ලද බලපෑම් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0990/'08

ගරු ජේමසිරි මානගේ මහතා,— ඛනිජ තෙල් හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය අගෝස්තු - සැප්තැම්බර් මාස තුළ ලෝක වෙළඳපොළේ තෙල් බැරලයක මිල අඩු වූ බව එතුමා දන්නෙහි ද?

(ආ) (i) 2008 ජනවාරි මාසයේ සිට 2008 ඔක්තෝබර් මාසය දක්වා කාලය තුළ ලෝක වෙළඳ පොළේ තෙල් බැරලයක මිල ගණන් වෙනස් වූ ආකාරය කවරේද;

(ii) මෙරටට පැමිණෙන විදේශ නැව්වලට හා මෙරට පාරිභෝගිකයින්ට ඩීසල් ලීටරයක් අලෙවි කරන මිල කොපමණද;

(iii) ගුවන් යානා සඳහා ඉන්ධන අලෙවි කිරීමේ මිල ගණන් කවරේද;

(iv) දේශීය ධීවර යාත්‍රාවලට ඩීසල් ලීටරයක් අලෙවි කරන මිල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) විදේශ නැව්වලට ලබාදෙන සහනය දේශීය ධීවර යාත්‍රා වලට ලබා නොදීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1012/'08

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2000 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ විදේශ රාජ්‍යවල අත්අඩංගුවට පත්වූ ශ්‍රී ලාංකික ධීවරයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් තවමත් සිරගතව සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට සිරගතව සිටින ධීවරයින්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) ඔවුන් සිරගත කර සිටින රට කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) සිරගතව සිටින ධීවරයින් නිදහස් කර ගැනීමට රජය විසින් මේ වනවිට ගෙන තිබෙන ක්‍රියාමාර්ග කවරේද;

(ii) සිරභාරයට පත්ව සිටින ධීවරයින්ගේ පවුල්වල අයට රජයෙන් ලබාදී තිබෙන සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1052/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) "අපි වවමු - රට නගමු" වැඩපිළිවෙළ යටතේ 2006 සිට 2008 වර්ෂය දක්වා ගාල්ල දිස්ත්‍රික්කයේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෙවතු වගා ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(ii) එම ව්‍යාපෘති සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්, විමධ්‍යගත අරමුදලින් හා පළාත් සභා මන්ත්‍රී අරමුදලින් වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඒ අනුව, 2006 වර්ෂයේදී සහ 2008 වර්ෂයේදී ගෙවතු වගා සිදු කළ වගාකරුවන් සංඛ්‍යාව සහ අදාළ භූමි ප්‍රමාණය එක් එක් වර්ෂයට අදාළව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) 2008 වර්ෂයේදීට වඩා ගෙවතු වගාකරුවන් දිරිගැන්වීමට 2009 වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

(ii) ඒ සඳහා ඉහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට වෙන් කිරීමට බලාපොරොත්තු වන මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1075/'08

ගරු ජිනදාස කිතුලගොඩ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) මහජන බැංකුවෙන් ලබාගත් ණය මුදල් නොගෙවා පැහැර හරින පෞද්ගලික ආයතන හා සමාගම් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නම්, එම පෞද්ගලික ආයතන හා සමාගම්වල නාම ලේඛනයක් හා ඔවුන් විසින් ගෙවිය යුතුව ඇති ණය ශේෂයන් වෙන් වෙන්ව කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එසේ නොගෙවා පැහැර හරින ලද ණය ශේෂයන් අය කර ගැනීමට මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1077/'08

ගරු ජිනදාස කිතුලගොඩ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වල අයිතිය, ගිවිසුම්වලට එළැඹීමෙන් තොරව සහ නීත්‍යානුකූල නොවන අයුරින් යම් යම් පුද්ගලයින්ට පවරා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉඩම් පවරා දී ඇති පදනම, පැවරුම්ලාභීන් සහ පවරා දී ඇති ඉඩම් ප්‍රමාණය කවරේද;

(ii) මෙසේ නීත්‍යානුකූල ක්‍රියා පටිපාටියකින් තොරව ඉඩම් පවරා දුන් නිලධාරීන්ට එරෙහිව විනයානුකූල පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0986/'08

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රේගු ත්‍යාග අරමුදල සහ රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදල යන අරමුදල් ක්‍රියාත්මකව පවතින්නේද;

(ii) එසේ නම්, රේගු ත්‍යාග අරමුදලින් 2004, 2005, 2006, 2007 සහ 2008 යන මූල්‍ය වර්ෂවලදී රේගු නිලධාරීන් වෙත ගෙවන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් එක් එක් වර්ෂවලදී සහ මේ දක්වා රේගු ත්‍යාග අරමුදලින් මුදල් ලබාගත් රේගු නිලධාරීන්ගේ නම් සහ ඔවුන් ලබාගත් මුදල් ප්‍රමාණයන් කවරේද;

(iv) 2004, 2005, 2006, 2007 සහ 2008 යන මූල්‍ය වර්ෂ සඳහා මේ දක්වා රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදලට බැර කර ඇති මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රේගු නිලධාරීන්ගේ කළමනාකරණ සහ වන්දි අරමුදල සහ රේගු ත්‍යාග අරමුදල යන අරමුදල්වල ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබුවේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 මාර්තු මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1155/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මාතර - කොළඹ දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගය සඳහා ඇස්තමේන්තුගත සම්පූර්ණ මුදල කොපමණද;

(ii) මෙතෙක් වැය කර ඇති මුදල කොපමණද;

(iii) මාර්ගය ඉදිකිරීම සඳහා කල සැලසුම්වලට අමතරව විවිධ හේතු මත අලුතෙන් එකතු කළ කාර්යයන් කවරේද;

(iv) ඒ සඳහා වියදම් වන අමතර මුදලේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සිදුවෙමින් පවතින සංවර්ධන තත්ත්වයන් සලකා බැලීමේදී අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් වන කාල සීමාව කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0750/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පාදුක්ක, මීපේ, හේවාගම්වත්ත, දියවර ගම්මාන ව්‍යාපෘතියක් සඳහා ඉඩම් බෙදා දීම සඳහා 90 දෙනෙක් තෝරාගෙන ඇති බවත්;

(ii) පාදුක්ක ප්‍රාදේශීය ලේකම් විසින් 2003.08.22 වැනි දින ඉඩම්ලාභීන්ගේ රැස්වීමක් කැඳවූ බවත්;

(iii) නැවත 2005.06.18 වැනි දින ආයතනවල නිලධාරීන් සහ මහජන නියෝජිතයින්ගේ ප්‍රධානත්වයෙන් පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ඉඩම්ලාභීන්ගේ රැස්වීමක් කැඳවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රදාන පත්‍රයක් ලෙස, රාජ්‍ය මුද්‍රාව සහිතව, "නිවාස අරමුණ වෙනුවෙන් ඉඩම් කොටසක් පවරාදීම" යනුවෙන් සඳහන්, කැබලි අංකය හෝ ඉඩම් ප්‍රමාණය සඳහන් නොකළ හිමිකම් පත්‍රයක් ඉඩම්ලාභීන්ට ලබාදී ඇති බවත්;

(ii) 2005.10.20 වැනි දින පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවති දියවර ගම්මානයේ ආරම්භක උත්සවයේදී නිවසක් සාදා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශයෙන් රු.50,000/= ක් ලබාදෙන බවට ඉඩම්ලාභීන්ට ලිපියක් ප්‍රදානය කළ බවත්;

(iii) කට්ටිලාභීන් තෝරා ගැනීමට අයදුම්පත් භාරගෙන ඇත්තේ 2000 වර්ෂයේ වන අතර 2001.08.09 දින ඉඩම් කච්චේරිය පාදුක්ක ප්‍රජාශාලාවේදී පැවති බවත්;

(iv) තෝරාගත් කට්ටිලාභීන්ගෙන් එක් අයෙකුගෙන් මැනීමේ ගාස්තු ලෙස රු.1,500/= ක් ද ඉඩම් ප්‍රතිසංස්කරණ සභා අයදුම්පත්‍ර ගාස්තු ලෙස රු.100/- ක්ද, ඉඩම් එළිපෙහෙළි කිරිමට වරින්වර රු.10,000/= ක්ද අයකර ගෙන ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) ඉහත අයට මෙතෙක් ඉඩම් නොලැබීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0347/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ නව රජය බලයට පත්වීමෙන් පසු අදාළ නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් මේ දක්වා විදේශ සංචාරය කළ රටවල් කවරේද;

(ii) එතුමා විසින් කරන ලද නිල හා පෞද්ගලික විදේශ සංචාර වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාර සඳහා එතුමා සමඟ සහභාගී වූ නිලධාරීන්ගේ නම් හා තනතුරු කවරේද;

(ii) එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩල නිලධාරීන් සහභාගි වූයේ නම් ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එතුමා ඇතුලු අනෙකුත් නිලධාරීන් විදේශගත වූ ගුවන් සමාගම හා ගුවන් පන්තිය කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) මෙම විදේශ සංචාර වලින් මෙරටට ලැබුණු විදේශ ආධාර, විදේශ ණය, ව්‍යාපෘති හෝ වෙනත් ප්‍රතිලාභයන් කවරේද යන්න එක් එක් සංචාරයට අදාළව වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0494/'08

ගරු විජිත හේරත් මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන කොපමණ සංඛ්‍යාවක් බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබේද;

(ii) එම වාහනවල වර්ගය, අංකය සහ මුදාහළ දිනය කවරේද;

(iii) කවර ආයතනයක් හෝ පුද්ගලයන් වෙත කවර පදනමක් මත මුදාහැර තිබේද;

(iv) අනුයුක්ත කිරීමක් සිදුකර තිබේනම් ඔවුන්ගේ නම හා තනතුර කවරේද;

(v) එම වාහන මුදාහැරීමට නිසි අනුමතියක් ලබා තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොඩනැගිලි බදු හෝ කුලී පදනමින් බාහිර පාර්ශ්වයන් වෙත ලබා දී තිබේද;

(ii) එකී ගොඩනැගිලි පිහිටි ස්ථානයන්හි ලිපිනය සහ අදාළ බදු හෝ කුලී පදනම කවරේද;

(iii) ලබා දී ඇති ආයතන හෝ පුද්ගලයින්ගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1055/'08

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලංකා බැංකුවේ නිලධාරීන් 2005 නොවැම්බර් මාසයේ සිට මේ දක්වා සහභාගි වූ විදේශ සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ කවර රටවල් සඳහා කවර දිනයන්හිදීද;

(iii) එම සංචාර සඳහා සහභාගි වූ අය කවුරුන්ද;

(iv) ඒ සඳහා වැයවූ මුදල් ප්‍රමාණය කොපමණද;

(v) එම මුදල් වැය කළේ කවර ආයතනයක් මගින්ද;

(vi) අදාළ විදේශ සංචාර මගින් ලංකා බැංකුවට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1056/'08

ගරු අජිත් කුමාර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ලංකා බැංකුව මගින් 2005 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට මේ දක්වා —

(i) එක් පුද්ගලයෙකුට හෝ ආයතනයකට රුපියල් මිලියන 50 ට වඩා ලබාදී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය ලබාදුන් ආයතන හා පුද්ගලයින් කවුරුන්ද;

(iii) එම ණය නිකුත් කිරීමට ප්‍රථම ඔවුන්/ එම ආයතන විසින් වෙනත් බැංකු වලින් හෝ ලංකා බැංකුවෙන් ණය ලබාගෙන ඒවා ගෙවීම පැහැරහැර තිබුණේද;

(iv) එසේනම් ගෙවීම පැහැරහැර ඇති එම ණය ලබාගන්නා ලද බැංකුව සහ මේවන විට ගෙවීමට ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2005 නොවැම්බර් මාසයෙන් පසුව රුපියල් මිලියන 50 ට වඩා ණය ලබාගත් අය / ආයතන විසින් තබා ඇති සුරැකුම් හා ඔවුන්ට/ආයතනවලට ලබාදුන් ණයවලට අදාළ පොලී අනුපාතිකය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1099/'08

ගරු ජෙමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ටින් මාලු සහ කරවලවලට අමතරව අමු මාලු විදේශ රටවලින් ආනයනය කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ ගෙන්වනු ලබන මාලු වර්ග කවරේද;

(ii) පසුගිය වසර 05 කාලය තුළ ආනයනය කරන ලද මත්ස්‍ය ප්‍රමාණය කොපමණද;

(iii) ඒ සඳහා බදු අයකිරීමක් සිදුකරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාලු ආනයනය සිදු කරන ආයතනය හෝ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) එලෙස ආනයනය කරන ලද මාලු අලෙවි කිරීම සිදුකරන්නේ ලංකා ධීවර සංස්ථාවේ අලෙවිසැල් මගින්ද;

(iii) එසේනම් එම අලෙවිසැල් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත කාලය තුළ එම අලෙවිසැල්වලට සපයන ලද මාලු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0996/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— ආගමික කටයුතු හා සදාචාර වර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පුරාවිද්‍යාත්මක දේපලක් ලෙස සලකන කළුතර, පලාතොට අක්කර 42ක ඉඩමක් සහිත "රිච්මන්ඩ් කාසල්" මන්දිරය අලුත්වැඩියා කළයුතු මට්ටමක පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) නොමිලේ ළදරු පාසල්, ජපන් භාෂා පන්ති, ඉංග්‍රීසි පන්ති මෙන්ම ළමා නිවාසයක් ද පවත්වාගෙන යන මෙම ස්ථානය උග්‍ර ජල ප්‍රශ්නයකට මුහුණදී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම ස්ථානය වැඩිදියුණු කර ප්‍රයෝජනයට ගැනීම සඳහා එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද;

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1004/'08

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007 නොවැම්බර් මස 19 වැනි දින අලුයම 1.00ට පමණ බෙලිඅත්ත පොලිසියට අයත් මානගල්ල ප්‍රදේශයේදී පොලීසිය සහ තවත් පිරිසක් අතර වෙඩි හුවමාරුවක් සිදුවූ බවත්;

(ii) ඉන් අයෙක් මරුමුවට පත්වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වෙඩි හුවමාරුව සිදුවූයේ කවර හේතුවක් නිසාද;

(ii) බෙලිඅත්ත පොලිසිය ඒ අවස්ථාවේ මානගල්ල ප්‍රදේශයට පැමිණියේ කවර හේතුවක් නිසාද;

(iii) අංක 252-6474 දරන කැබ් රථයෙන් මැර කණ්ඩායමක් රැගෙන බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති එම ස්ථානයට පැමිණියේ කවර හේතුවක් නිසාද;

(iv) ප්‍රාදේශීය සභාවේ සභාපති පොලිසියට වෙඩි තැබීමක් සිදුකළේ නම් ඔහු මෙතෙක් අත්අංඩගුවට ගෙන නීතිමය පියවර නොගන්නේ කවර හේතුවක් නිසාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1006/'08

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1981 අංක 39 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ (විශේෂ විධිවිධාන) පනතේ 27 අ(1) වගන්තියට අනුව, අංක 195/6 හා 1982.05.31 දිනැති ගැසට් පත්‍රය මගින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ගා/බද්දේගම, පිලගොඩ, වැලිවත්ත ඉඩම රාජ්‍ය වැවිලි සංස්ථාවට පවරා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ තිබියදී, කොළඹ 14, සිරිමාවෝ බණ්ඩාරනායක මාවතේ, අංක 811/1 හි බර්න්ස් ට්‍රේඩිං සමාගමේ 2002.03.16 දිනැති බදු ඉල්ලීම් ලිපියට, එවකට ඉඩම් අමාත්‍යවරයා විසින් 2002.05.16 දින අනුමතිය ලබාදුන්නේ කෙසේද;

(ii) 2003 පෙබරවාරි 26 දින අංක 260 දරන බදු ඔප්පුව මගින් ඉහත සමාගමට කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතියක් සඳහා අවුරුදු 50 ක කාලයකට බදු දුන්නේ කවර නීත්‍යානුකූල තත්ත්වයක් මතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත බදු ගිවිසුමේ 11 වැනි වගන්තියට අනුව අදාළ ව්‍යාපෘතිය මාස 06 ක කාලයක් තුළ ආරම්භ නොකිරීමට හේතුවෙන් එම බදු ගිවිසුමද අවලංගු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) ඉහත බදු දුන් දින සිට මේ දක්වා ලබාදී ඇති බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් තමන්ට අයිති නොවන දේපලක් බදු දී ඇති බැවින් අදාළ බදු ගිවිසුම අවලංගු කර රාජ්‍ය වැවිලි සංස්ථාවට එම ඉඩම පැවරීම කවර කාල සීමාවක් තුළ සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන් ද ?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 මාර්තු මස 20 වැනි සිකුරාදා)

0560/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ සිට අද දක්වා වාර්ෂිකව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබාදී ඇති ආධාර, ප්‍රදානයන් සහ ආධාර සඳහාවූ පොරොන්දුවල මුළු වටිනාකම ඒවාට අදාළ පොලී අනුපාතිකයන් ද සමග කොපමණද;

(ii) ඊට අමතරව ශ්‍රී ලංකාවට ලබාදුන් වෙනත් විශේෂ සහනාධාර කවරේද;

(iii) එසේ සහනාධාර ලබා දී ඇත්නම්, ඒවා ලබාදුන් දිනය සහ එසේ ලබාදුන් සහනාධාර ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඊට ප්‍රතිඋපකාරයක් වශයෙන් 2004 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික පදනමින් ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවට ප්‍රදානය කර ඇත්තේ කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2001 වර්ෂයේ සිට අද දක්වා සෑම වර්ෂයක් අවසානයේදීම ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පැවති ගෙවුම් ශේෂය කොපමණද යන්නත් එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0561/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2004 වර්ෂයේ සිට අද දක්වා වාර්ෂිකව චීනය විසින් ශ්‍රී ලංකාවට ලබාදී ඇති ආධාර, ප්‍රදානයන් සහ ආධාර සඳහාවූ පොරොන්දුවල මුළු වටිනාකම ඒවාට අදාළ පොලී අනුපාතිකයන් ද සමග කොපමණද;

(ii) ඊට අමතරව ශ්‍රී ලංකාවට ලබාදුන් වෙනත් විශේෂ සහනාධාර කවරේද;

(iii) එසේ සහනාධාර ලබා දී ඇත්නම්, ඒවා ලබාදුන් දිනය සහ එසේ ලබාදුන් සහනාධාර ප්‍රමාණය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඊට ප්‍රතිඋපකාරයක් වශයෙන් 2004 වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂික පදනමින් ශ්‍රී ලංකාව විසින් චීනයට ප්‍රදානය කර ඇත්තේ කුමක්ද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) 2001 වර්ෂයේ සිට අද දක්වා සෑම වර්ෂයක් අවසානයේදීම ශ්‍රී ලංකාව හා චීනය අතර පැවති ගෙවුම් ශේෂය කොපමණද යන්නත් එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 අප්‍රේල් මස 07 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0991/'08

ගරු ප්‍රේමසිරි මානගේ මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පුද්ගලයින් ලෙස රජයට ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පුද්ගලයින් මත අයකරන ආදායම් බදු වලින් පසුගිය වර්ෂ දෙක තුළ ඉපයූ මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) පුද්ගලයින් මත ආදායම් බදු අයකිරීමේදී අනුගමනය කරන වාර්ෂික ආදායම් සීමාවන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 අප්‍රේල් මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0099/'08

ගරු රවි කරුණානායක මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මිහින් එයාර් ගුවන් සේවය සඳහා ආරම්භයේ සිට මේ දක්වා බදු පදනම මත ලබා ගෙන ඇති, මිලට ගෙන ඇති හෝ කුලියට ලබා ගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික පදනමින් ගෙවා ඇති හෝ ගෙවනු ලබන මුදල් ප්‍රමාණය කවරේද;

(iii) සමායන මට්ටම පවත්වා ගැනීම සඳහා ප්‍රවාහනය කළ යුතු මඟී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය කොපමණද;

(iv) ගුවන් සේවාව ආරම්භ කරන අවස්ථාවේ සිට ප්‍රවාහනය කළ යුතුව තිබූ මඟී සංඛ්‍යාව සහ භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

(v) සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රවාහන ධාරිතාව සහ අද වන විට ප්‍රවාහනය කර ඇති සමස්ත ගුවන් භාණ්ඩ ප්‍රමාණය මාසික පදනමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්ධන, ගුවන් තොටුපල හා ගුවන් සේවා කාර්යාල ඉඩකඩ සහ ගබඩා ඉඩකඩ, බදු වර්ග, ගුවන් යානා සඳහා ගෙවිය යුතු ගාස්තු, බැංකු ණය සහ අනෙකුත් විශේෂයෙන් සිදු කළ යුතු ගෙවීම්වලට අදාළව අද දින වන විට ගෙවීමට ඇති මුළු මුදල සහ එම එකිනෙක සඳහා කාලය අනුව ඉදිරිපත් කරන විශ්ලේෂණය කවරේද;

(ii) බඳවා ගත් සමස්ත කාර්ය මණ්ඩලය, ඔවුන්ට මාසිකව ගෙවිය යුතු ප්‍රේෂණවල මුළු වටිනාකම සහ රුපියල් 200,000/- ඉක්මවා වැටුප් ලබන සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් හට ලබා දෙන වෙනත් වරප්‍රසාද සඳහා මාසිකව වැය කරන මුළු මුදල කොපමණද;

(iii) සේවා ගිවිසුම් මගින් රක්ෂණ ආවරණයක් ලැබී තිබියදීත් ගුවන් යානා කාර්ය මණ්ඩල නඩත්තු රක්ෂණය (ACMI) වෙනුවෙන් ගෙවනු ලබන අමතර ගාස්තුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0752/'08

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ජාතිය ගොඩනැඟීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 2004 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජුනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටින සමෘද්ධිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවන ලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2004, 2005, 2006 සහ 2007 වර්ෂවල සමෘද්ධිලාභීන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂ තුළ සමෘද්ධිලාභීන් වශයෙන් සිටි එහෙත් පසුව ඉන් ඉවත් කරන ලද සංඛ්‍යාව සහ එම අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද්දේ කවර පදනමක් යටතේද;

(iii) අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටීනම් එම අයට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2009 අප්‍රේල් මස 21 වැනි අඟහරුවාදා)

0947/'08

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 පෙබරවාරි මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 163/9) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාලසීමාවේ එක් එක් දිනයේදී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0948/'08

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 මාර්තු මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 163/13) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාලසීමාවේ එක් එක් දිනයේදී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0949/'08

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 අප්‍රේල් මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 164/1) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාලසීමාවේ එක් එක් දිනයේදී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0950/'08

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2006 මැයි මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 164/9) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාලසීමාවේ එක් එක් දිනයේදී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0951/'08

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 ජුනි මාසයේ පැවති හදිසි නීති විවාදයේදී ඉදිරිපත් කරන ලද කරුණුවලට අනුව (හැන්සාඩ් පිටපත් අංක 164/18) උතුරු නැගෙනහිර යුද්ධ මෙහෙයුම් වලදී අදාළ කාලසීමාවේ එක් එක් දිනයේදී මියගිය යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා සහ පොලිස් භට සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අය අනුයුක්තව සිටි කඳවුර හෝ සේවා ස්ථානය කවරේද;

(ii) මියයන/තුවාල ලබන විට ඔවුන් සේවයේ යෙදී සිටි ක්‍රියාන්විතය සහ මිය ගිය දිනයන් කවරේද;

(iii) ඔවුන්ගේ නම් සහ පෞද්ගලික ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ගෙන් යැපෙන්නන් සහ ලබාදී ඇති දීමනා කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත අය වෙනුවෙන් වැටුප් හා විශ්‍රාම මුදල් ගෙවන්නේ නම්, එම දීමනා ලබන්නේ කවුරුන්ද;

(ii) ඒ කවර ප්‍රාදේශීය ලේකම් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකින්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2009 අප්‍රේල් මස 24 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0005/'08

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පෙර සිටි සභාපතිවරුන් වන ගරු ජෝන් අමරතුංග මහතා, ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මහතා සහ ගරු රෝහිත බෝගොල්ලාගම මහතා විසින් ද, 2007 ජනවාරි මස 12 වැනි දින, ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින්ද, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද එකී කාරක සභාවේ වාර්තා සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු විගණකාධිපති මායාදුන්නේ මහතා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජූලි මස 20 වැනි දිනැති වාර්තාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රවුෆ් හකීම් මහතා විසින් 2007 නොවැම්බර් මස 29 වැනි දින ඉදිරිපත් කරන ලද අංක PS12 දරන වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ගය කවරේද;

(ii) ඒ අනුව විමර්ශනයට භාජනය කරනු ලැබූ ආයතන කවරේද; සහ

(iii) කාරක සභා වාර්තාවේ නියමයන්ට අනුව ආරම්භ කර ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0013/'08

ගරු රවි කරුණානායක මහතා,— ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යතුමා සහ ව්‍යවසාය සංවර්ධන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) රටේ ක්‍රියාත්මකව පවතින රූපවාහිනී මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) බලපත්‍ර නිකුත් කර ඇතත්, මෙහෙයුම් ආරම්භ කර නොමැති රූපවාහිනී මධ්‍යස්ථාන සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම රූපවාහිනී මධ්‍යස්ථානවල විකාශය කිරීමේ සංඛ්‍යාතය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දේශීය චිත්‍රපට කර්මාන්තයට සහාය ලබාදෙන චේතනාවෙන් රට තුළට විදේශ රූපවාහිනී චිත්‍රපට ගලා ඒම අධෛර්යමත් කරනු සඳහා රජය විසින් බදු හඳුන්වා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එමගින් අපේක්ෂිත අභිමතාර්ථය සැපිරී තිබේද;

(ii) එසේ නම්, මෙවැනි ප්‍රතිලාභ ලබාගෙන ඇති ස්ථාන සහ ආකාර කවරේද;

(iii) බද්ද පැනවූ දින පටන් අද දක්වා එක් එක් රූපවාහිනී මධ්‍යස්ථානය විසින් මාසිකව ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) (i) මෙම රූපවාහිනී මධ්‍යස්ථානවලට පනවා ඇති අනෙකුත් බදු කවරේද;

(ii) රජය විසින් ඉකුත් මාස 12ක කාලය තුළ උපයාගත් මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2009 මැයි මස 05 වැනි අඟහරුවාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0080/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 1994 අප්‍රේල් මස විසි පස් වැනි දින සිට මේ දක්වා—

(i) ඒක පුද්ගල ණය;

(ii) ගෙවිය යුතු පොළිය සමඟ මුළු ණය;

(iii) ඇමෙරිකානු ඩොලරයේ වටිනාකමට සමාන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය;

(iv) ආයාත අනුපාතයට සාපේක්ෂව සංචිත;

(v) දරිද්‍රතා මට්ටම;

(vi) මසකට රුපියල් 1,000/- ට අඩුවෙන් ආදායම් ලබන පවුල් සංඛ්‍යාව;

(vii) ගෙවුම් ශේෂය;

(viii) සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) - (viii) අනුව, රට ප්‍රගතියක් ලබා තිබේද නැතිනම් වර්ධනය හීන වී තිබේද යන්න සාක්ෂි සහිතව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0081/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2007 ඔක්තෝබර් මස 23 වැනි දින හෝ ඊට ආසන්න දිනක එච්.එස්.බී.සී. බැංකුවේ මැදිහත්වීම තුළින් ස්වෛරීත්ව ඇපකරයක් (Sovereign Guarantee) ලබා දී ඩොලර් මිලියන 500ක බැඳුම්කරයක් ලබා ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ලබා ගත් මුලු මුදල කොපමණද;

(ii) ඉදිරිපත් කරන ලද පොළී අනුපාතිකය, එකඟවන ලද කොන්දේසි හා ඇපය අවසන් වන දිනය කවරේද;

(iii) මෙම ඇමෙරිකන් ඩොලර් මිලියන 500 ලබා ගැනීම සඳහා වූ වියදම කොපමණද;

(iv) එය ස්ථාවර හෝ නම්‍ය අනුපාතිකයක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මාස 60 කට මුදල් ප්‍රතිපාදනය කිරීම සඳහා රාජ්‍ය ණය අරමුදලක් ස්ථාපිත කර තිබේද;

(ii) එසේ නම්, මාසිකව වෙන් කරනු ලබන මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) අද වන විට ඇමෙරිකා එක්සත් ජනපදයේ ලන්ඩන් ඉන්ටර් බැන්ක් (LIBOR) හි අනුපාතය හා ෆෙඩරල් රිසර්ව්ස් (FEDEX) හි අනුපාතය කවරේද;

(iv) ණය මුදල ලබාදුන් අවස්ථාවේ දී ඉහත අනුපාතයන් කවරේද;

(v) මුදල් වියදම් කළේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0082/'08

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2007 දෙසැම්බර් මස 31 වැනි දින වන විට එක් රාජ්‍ය ආයතනයක් විසින් තවත් රාජ්‍ය ආයතනයක් වෙත ගෙවීමට තිබූ මුළු මුදල කොපමණද;

(ii) ගෙවීමට ඇති මුදල් ආයතනයේ පැවැත්මට විශාල ගැටළුවක් වී ඇති ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා කොළඹ මහ නගර සභාව වැනි ආයතන කවරේද;

(iii) ඉහත සඳහන් ආයතනවලට අදාළව පසුගිය වසර 5ක කාලය සඳහා විස්තරාත්මක විශ්ලේෂණයක් කවර ආකාරයක් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දැනුම්දෙන්නෙහිද?

(ආ) (i) ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, කොළඹ මහ නගර සභාව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, මිහින් එයාර් සමාගම, අධ්‍යාපන දෙපාර්තමේන්තුව හා පොහොර සංස්ථාව යන ආයතනවල හිඟ මුදල් තිබීමට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඒවා ගෙවනු ලබන දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2009 ජුනි මස 12 වැනි සිකුරාදා

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අමාත්‍ය ධුරයන් දැරීමෙන් වැළැක්වීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2007 ජූලි 06) "ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, තම ඇමතිවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත් ජනාධිපතිවරයා හා අගමැතිවරයා කිසිදු අමාත්‍ය ධුරයක් නොදැරිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 3/'05]

පා. 1/'08

ගරු රවි කරුණානායක මහතා,— අවි ආයුධ ලියාපදිංචි කිරීම,— ශ්‍රී ලංකාවේ පවතින සියලුම අවි ආයුධ ලියාපදිංචි කළ යුතු අතර, එසේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව යම් කිසිවෙකු ලියාපදිංචි නොකළ ආයුධයක් ළඟ තබා ගෙන අසුවුවහොත්, අපරාධ නීතිය උල්ලංඝණය කිරීමේ වරද යටතේ ඔහුට එරෙහිව නඩු පවරා, අවුරුදු 20 ක අනිවාර්ය සිර දඬුවමකට යටත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 2/'08

ගරු රවි කරුණානායක මහතා,— බැංකු ගනුදෙනු වේලාවන් දීර්ඝ කිරීම,— රටේ ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බැංකු ගණුදෙනු වේලාවන් පැය 9.00 සිට පැය 16.00 දක්වා දීර්ඝ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 3/'08

ගරු රවි කරුණානායක මහතා,— කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීම,— රිසි සේ මත්පැන් විකිණීම මෙරට සදාචාරාත්මක වටිනාකම් පිරිහීමට හේතු වී ඇති බැවින්, කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීමට නීති පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 4/'08

ගරු රවි කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 5/'08

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 6/'08

ගරු රවි කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 7/'08

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 8/'08

ගරු රවි කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 9/'08

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 10/'08

ගරු රවි කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 11/'08

ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'08

ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'08

ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'08

ගරු රවි කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'08

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'08

ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 17/'08

ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් නීතිගත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'08

ගරු රවි කරුණානායක මහතා,— "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට ඍජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'08

ගරු රවි කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ස්ත්‍රී අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් ඇතුළු විවිධ දක්ෂතා ඇති පුරවැසියන්ට තම නව නිපැයුම් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත් අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුළු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසැල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසැල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩපිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුළු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුළු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම සඳහා වෘත්තීමය සුදුසුකම් හා පලපුරුද්ද ඇති පුද්ගලයන් පමණක් තෝරා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන්හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කිරීම,— දිවයින පුරා නැවත සමීක්ෂණයක් කර ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන් හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කිරීම,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කර සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පිළිබඳව පමණක් සොයා බැලීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම එකම අධිකරණයක් තුළ දී කළ හැකි වන අයුරින් නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— පාසැල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසැල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා ජනතාව තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ක්‍රීඩා පාසැල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසැල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/'08

ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 37/'08

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් වහාම ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව වහාම ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/'08

ගරු විජිත රණවීර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/'08

ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/'08

ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/'08

ගරු විජිත රණවීර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අඳ ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අඳ ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අඳ ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අඳ ගොවීනට වූ එම අසාධාරණය දුරුලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'08

ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ථ වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.